විගණකාධිපති චක්‍රලේඛ අංක - 2017/08 2017 පෙබරවාරි දින

විගණකාධිපති දෙපාර්තමේන්තුව

306/72

පොල්දූව පාර

බත්තරමුල්ල

සියළුම නිලධාරීන් වෙත,

**විදේශ සංචාරවලින් පසු ඉදිරිපත් කළ යුතු වාර්තා**

**-----------------------------------------------------**

විදේශ සම්මන්ත්‍රණ, වැඩ මුළු, රැස්වීම්, අධ්‍යයන චාරිකා හා පුහුණුවීම් කටයුතු සඳහා සහභාගී වන නිලධාරීන් ඒවායෙන් ලබාගත හැකි උපරිම ප්‍රයෝජන ලබාගෙන ඇති බව නිශ්චය කිරීම සඳහා අදාළ විදේශ සංචාරය පිළිබඳ වාර්තාවක්, එම සංචාරය නිමවී නැවත දිවයිනට පැමිණි දින සිට දින 10 ක් ඇතුළතදී මා වෙත ඉදිරිපත් කළ යුතුය. කණ්ඩායමක් වශයෙන් සහභාගී වූයේ නම් කණ්ඩායම් නායකයා විසින් සියල්ලම නියෝජනය වන පරිදි වාර්තාව පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.

02. අදාළ වාර්තාවේ නිලධාරියාගේ නම, තනතුර, විදේශ ගත වූ කාරණය, කාලය හා රටද එම සංචාරය තුළින් ශ්‍රී ලංකාවේ උන්නතිය සඳහා උපයෝගී කර ගත හැකි ක්‍රමවේද වෙතොත් එම කරුණුද තමන් ලබාගත් ප්‍රගතිය පිළිබඳ සියළු කරුණුද ඇතුළත් විය යුතුය.

03. ඒ අනුව සංචාරය ප්‍රදානය කරන ආයතනය වෙත, දෙපාර්තමේන්තුවේ විදේශ ශිෂ්‍යත්ව අංශයේ අධීක්ෂණයෙන් හා සංස්කරණයෙන් අවශ්‍යතාවය පරිදි වාර්තාවක් නිකුත් කිරීමට කටයුතු කෙරෙනු ඇත.

විගණකාධිපති